REFERENCE NOT TO BE REMOVED FROM THE LIBRARY

# ශ්‍රී ලංකාවේ ගම්පහ දිස්ත්‍රික්කයේ කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපන අදියර අවසන් කරන ( 10 ශ්‍රේණිය ) සිසුන්ගේ අදහස් ප්‍රකාශනය පිළිබඳ ව පවත්නා ගැටලු විචාරාත්මක ව විමසා බැලීමට කෙරුනු අධ්‍යයනයකි.

දර්ශනපති ( අධ්‍යාපන විද්‍යා ) උපාධිය.

M.Phil. 39.

ඩබ්. ඒ. ඩබ්. ද එස්. කේ. වීරසිංහ,
ශාස්ත්‍රවේදී ( ලංකා )
ශාස්ත්‍රවේදී ගෞරව ( ලංකා )
අධ්‍යාපන ඩිප්ලෝමා ( ලංකා )
අධ්‍යාපන හා වෘත්තීය මාර්ගෝපදේශ
සහතික පත්‍රය ( ලංකා ).

අධ්‍යාපන පීඨය,
ශ්‍රී ලංකා කොළඹ විශ්ව විද්‍යාලය,
කොළඹ.

1982.07.09

UCLIB
383876

## සංක්ෂේපයෙන්.

ශ්‍රී ලංකාවේ සිසුන්ගේ සමස්ථ අධ්‍යාපන ක්ෂේත්‍රය ම මෙහෙයවන අධ්‍යාපන මාධ්‍යය සිංහල භාෂාවයි. අද්‍යතන ලංකාවේ පාලන ක්ෂේත්‍රය මෙහෙයවන්නේ ද රාජ්‍ය භාෂාව වන සිංහල භාෂාවෙනි. එපමණක් නොව, සමාජය කාර්යක්ෂම ව පවත්වා ගැනීමටත්, අවශ්‍ය සුදුසු වෘත්තීය පුද්ගලයන් පුහුණු කර ගැනීමටත්, තෝරා ගැනීමටත්, උසස් අධ්‍යාපනයට සුදුස්සන් තෝරා ගැනීමටත්, බෙහෙවින් වැදගත් වන්නේ මව් බස වන සිංහලයි. ඕනෑ ම විෂයයක විෂයය දක්ෂතාවය ප්‍රකට කළ හැක්කේ ද භාෂා නිපුණත්වයේ පමණටය. ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වන මුළු ශ්‍රේණයීම් ක්‍රියාවලිය ද භාෂාව පදනම් කොට පවතී.

එබැවින් කණිෂ්ඨ ද්විතීයික අධ්‍යාපන අවසාන අදියර ගත කරන සිසුන්ගේ අධ්‍යාපන කාර්යය භාෂාමය දක්ෂතා අමතක කොට කළ හැකි යයි සිතතොත් ඒ මුළාවෙකි. අදහස් ප්‍රකාශනය, කණිෂ්ඨ ද්විතීයික භාෂා කුශලතා අතර ප්‍රමුඛ ස්ථානයක් ගනී. සිසුන් විසින් ග්‍රහණය කර ගත් අදහස්, අවස්ථානුකූල ව, චමත්කාර ව, නිවැරදි ව, නිරවුල් ව ප්‍රකාශ කිරීමට නම් ලිවීමේ කුශලතාව ප්‍රගුණ විය යුතුය. එහෙත් අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ, අවබෝධය, රස වින්දනය ආදී භාෂා දක්ෂතා ප්‍රමාණාත්මක ව නොලැබීම නිසා විවිධ බාධකයනට මුහුණපා ඇති සිසු පිරිස සුළුපටු නොවේ. කථා කරන බස හා ලියන බස අතර වෙනස පවා නොදන්නා ඔවුන් ගුරුවරුන්ට මෙන් ම මුළු මහත් සමාජයට ද අද ගැටළුවක් වී තිබේ. එබැවින් එම දුර්වලතාවන්ට පාදක වන හේතු සොයා සිසුන් වෙතින් ඒවා ඉවත් කළ යුතුය. සිසුන් තුළ පවත්නා ලිවීමේ දුර්වලතා මොනවා ද? සාපේක්ෂ ව එම දුර්වලතාවනට බලපෑ සාධක මොනවා ද? යෙදිය යුතු ප්‍රතිකර්ම මොනවා දැයි විචාරාත්මක ව අධ්‍යයනය කිරීම මෙහි තේමාව වෙයි. මේ දුර්වලතා අධ්‍යයනය කිරීමට ගම්පහ අධ්‍යාපන දිස්ත්‍රික්කයෙන් අහඹු ලෙස තෝරා ගත් ශිෂ්‍ය නියැදියකට හා ගුරු නියැඳියකට ප්‍රශ්නාවලියක් දී ඒ මගින් ඊට හේතු අධ්‍යයනය කොට ප්‍රතිකර්ම සාකච්ඡා කිරීම මෙම අධ්‍යයනයෙහි ප්‍රධාන පියවර වෙයි.